<u>අරණායක ප්‍රාදේශීය සභාව</u>
<u>කෑගල්ල දිස්ත්‍රික්කය</u>

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

11. <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>මතය.</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට අරණායක ප්‍රාදේශීය සභාවේ  සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
----------------------

(අ ) පුස්තකාල පාඨක පරිත්‍යාග පොත් වටිනාකම රු.76,912 ක මුදල ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත නොකර පුනරාවර්ථන ආධාර යටතේ ගිණුම්ගත කිරීම නිසා පුනරාවර්ථන ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා ප්‍රාග්ධන ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ රු. 78,808 ක පොලී ආදායම් වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වැය යටතේ දැක්විය යුතු රු.62,000 ක් වටිනා බහුකාර්ය ප්‍රොජෙක්ටරයක් හා 23,375 ක්වූ ඇලුමිනියම් ඉනිමගක එකතු වටිනාකම් වූ රු. 85,375 ක් පුනරාවර්තන වැය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) පළාත් සභා ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 108 කට අදාල මූලධන ආධාර හා මූලධන වියදම 23,303,433 ක් වුවත් එය රු237,904,234 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා මූලධන වියදම රු.214,600,801 ක් බැගින් වැඩියෙන් මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්
------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 02 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.7,469,365 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.6,448,692 ක් වූයෙන් වෙනස රු.1,020,673 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

-----------------------

වසර 12 ක සිට ඉදිරියට එන රු.672,333 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

---------------------

2015 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.451,478 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

2015 දෙසැම්බර් 31 ට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ණයහිමියෝ රු.42,215 ක් විය.

1.3.5 නීති රීති රෙගුලාසි හා කමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි හා කමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | සබරගමුව පළාත් සභාවේ මුලා රීති සංග්‍රහයේ | |
| | i 261.2.7 | 1999 ජූලි මසසිට 2000 ජනවාරි අතර අවස්ථා 06 කදී නිකුත් කරන ලද රු.44,483 ක අග්‍රිම මුදල් 2016 අප්‍රේල් 02 දිනට ද පියවා නොතිබුණි. |
| (ආ) | සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් ගේ 2010 නොවැම්බර් 16 දිනැති සීඑම්/ඒඩී/20/03 දරන චක්‍ර ලේඛය | කණිෂ්ඨ සේවකයින් වශයෙන් පත්වීම් ලබා ඇති සියලු සේවකයින් පත්වීම දී ඇති තනතුරේම යෙදවිය යුතු වුවත් ඊට පටහැනිව සභාවේ කම්කරු තනතුරු ලබාසිටිසේවකයින් 10 දෙනෙකු වෙනත් කාර්යයන්හි යොදවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 9,930,291 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.4,537,109 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,393,182 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු.5,393,182 ක වර්ධනයට ආදායම් විෂයයන් 04 ක වැඩිවීම හා වියදම් විෂයයන් 05 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

ලේකම්වරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2015.12.31 දිනට හිඟය

| ආදායම් ප්‍රභවය | 2015 ජනවාරි01 දිනටහිඟය රු. | 2015දෙසැම්බර් 31 දිනට හිඟයෙන් අයකිරීම රු | 2015 වර්ෂයේ බිල් කිරීම් රු | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම රු | 2015 ජනවාරි 01 දිනට පැවති හිඟයෙන රු | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය රු | මුළු හිඟය රු |
|---|---|---|---|---|---|---|---|
| i වරිපනම් හා බදු | 1,028,540 | 613,121 | 2,380,546 | 1,975,912 | 415,419 | 404,634 | 820,053 |
| ii බදු කුලී | 18,127 | 13,569 | 378,680 | 63,818 | 4,558 | 314,863 | 319,420 |
| iii බලපත්‍ර ගාස්තු | - | - | 151,175 | 149,875 | - | 1,300 | 1,300 |
| Ivවෙනත්ආදායම් | 11,440,141 | 9,835,128 | 37,848,967 | 26,164,292 | 1,605,013 | 11,684,675 | 13,289,688 |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

(i) උසාවි දඩ රු. 777,437

(ii) මුද්දර ගාස්තු රු. 9,921,609

2.3.3 කඩ බදු

---------

දිප්පිටිය පොදු වෙළඳ සංකීර්ණයේ පවත්වාගෙන යන ලද මස් කඩ හා මාළු කඩ 03 කට අදාල බදුහිමියන් 05 දෙනෙකුගෙන් 2000 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අයවිය යුතු රු.112,645 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

(අ) දිප්පිටිය නගරය තුළ පිහිටි සභාව සතු ඉඩම් කොටස් වාර්ෂිකව බදු ගෙවීමේ පදනම ලබාගත් පුද්ගලයින් විසින් අනවසරයෙන් මහල් නිවාස හා ව්‍යාපාරික ගොඩනැගිලි ඉදිකර පදිංචියටත් ව්‍යාපාරික කටයුතු සඳහාත් යොදාගෙන තිබුණි. එම දේපොල හඳුනාගෙන බදු ගිවිසුමේ කොන්දේසි අනුව බදුකරුවන් ඉවත් කිරීමටත් දේපොල වර්තමාන වටිනාකම මත බද්දට දීමටත් ක්‍රියා කර නොතිබුණි.

(ආ) මධ්‍යම වෙළඳ පල භූමියේ සහ දිප්පිටිය ක්‍රීඩාපිටිය භූමියේ අනවසර ඉදිකිරීම් සිදු කරන බවට තොරතුරු ලැබී තිබුණ ද එම ඉදිකිරීම් නතර කිරීමටත් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමටත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ 2014 වර්ෂයේ ජූනි, ජූලි හා අගෝස්තු යන මාස සඳහා ලද රු.3,000,000 ක මුදලින් 2015 දෙසැම්බර් 31 දින ව්‍යාපෘති අවසන් කිරීමට අපොහොසත් වීම මත 2015 අගෝස්තු 19 දින රු.1,107,440 ක මුදලක් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ලද රු.1,000,000 ක මුදලින් රු.641,281 මුදලක් වර්ෂය අවසාන වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(ඈ) සභා තීරණයක් මත සභාපතිවරයාගේ මාසික ඉන්ධන සීමාව ලීටර් 600 ක් වුවත් එම සීමාව ඉක්මවා 2014 අගෝස්තු සහ 2015 ජනවාරි මාසයන් තුළ ලබාදෙන ලද ඉන්ධන ලීටර් 83.73 ක් වෙනුවෙන් රු.9,467 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

උඩරට සංවර්ධන අධිකාරියේ ප්‍රතිපාදන මත රු.4,588,212 ක වියදමක් දරා ඉදිකරන ලද ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ ලිප, මෘත දේහයක් ආදාහනය කිරීමට ඇතුළුකළ අවස්ථාවේ විශාල ශබ්දයක් සමඟ පිපිරීමක් ඇතිවී ආදාහනාගාරයේ ලිප කොටස, ඉදිරිපස දොර හා පිටුපස දොර දෙපැත්තේ බිත්ති පුපුරා ගිය බැවින් අළුත්වැඩියා කටයුතු සඳහා මෙම ආදාහනාගාරය ඉදිකල සමාගම රු.1,353,300 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. ආදාහනාගාරය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයේ රක්ෂණය කර තිබුණු බැවින් රක්ෂණ වන්දි සඳහා අයදුම්කර තිබුණද රක්ෂණ ආයතනය කරන ලද පරීක්ෂණ වලදී අනාවරණය වූ ආකාරයට නිසි පරිදි නඩත්තු කටයුතු සිදු නොකිරීමෙන් මෙම හානිය සිදු වූ බවට නිගමනය කර රක්ෂණ වන්දි ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය.

--------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛණයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණු වැඩ විෂයන් 04 ක එකතුව රු. 150,000 ක ප්‍රතිපාදන 100% ක්ද, වැඩ විෂයයන් 07 ක එකතුව රු.504,722 ක ප්‍රතිපාදන වලින් 88% ත් 95% ත් අතර ද වශයෙන් එකතුව රු.654,722 ක් සභා කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) ආදායම් ශීර්ෂ 01 ක එකතුව රු.150,000 ක ඇස්තමේන්තුගත ආදායම මුළුමනින්ම උපයා නොතිබුණි.

(ඇ) ආදායම් ශීර්ෂ 05 ක ඇස්තමේන්තුගත ආදායමින් 50%ත් 91% ත් අතර වූ එකතුව රු.94,470 ක ආදායම් උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඉ) අයවැය පාලනය